
## <u>3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.</u>

### <u>3.4.2 මුහුණ රචනා කරමු.</u>

අංගරචනයේදී නලු නිළියන්ගේ මුහුණු වෙනස් කිරීමට අංගරචනා ශිල්පියාට අයිතියක් ඇති නමුත් එය නාට්‍ය අධ්‍යක්ෂක වරයාගේ අණුදැනුම යටතේ සිදු විය යුතුය.මන්ද යම් චරිතයක් ප්‍රේක්ශකයා වෙතට ඉදිරිපත් කිරීමේ දී එම චරිතය පිළිබඳව වඩාත් පැහැදිලි අදහසක් පවතින්නේ ඔහු සතුව වන බැවිනි. අංගරචනා ශිල්පියා අධ්‍යක්ෂක වරයාට මෙන් ම ප්‍රේක්ෂකයාට ද වග කිව යුතුය.

මනුෂ්‍ය මුහුණ ඒකාකාරී නැත.තොල් මහත හෝ සිහින් ,නලල පටු හෝ උස,කම්මුල් මහත හෝ රැළි වැටුන ,හතරැස් හෝ දිගටි මුහුණ ලෙස මුහුණු වල හැඩය විවිධාකාරය. නමුත් අංගරචනා ශිල්පියාට මුහුණ වෙනස් කිරීම,සකස් කිරීම හෝ මුහුණ ප්‍රතිනිර්මාණය කිරීමට හැකියාව තිබිය යුතුය.නාට්‍ය අධ්‍යක්ෂක වරයා විසින් ඉල්ලා සිටින චරිත ස්විභාවය සිරුරේ රචනි කිරීම අංගරචනා  ශිල්පියා සිදු කරයි.උදිහරණයක් ලෙෂ නීග්‍රෝ ජාතිකයෙක් ලෙෂ රඟ පෑමට සිටින නලුවාගේ මුහුණ තළඑලලු ,තොල් සිහින් ,කුඩා නාසයක් ස්වාභාවයෙන් හිමි වූ නලුවෙක් නම් අංගරචනා ශිල්පියා එම නලුවාගේ තොල් මහත් කොට නාසය පැතලි ලෙස නිර්මාණය කළ යුතුය.මෙයින් පෙනෙන්නේ අංගරචනා ශිල්පියාට පැවරී ඇති රාජකාරියේ බරපතලකමයි.




නවක අංගරචනා ශිල්පියෙක් ලෙස ඔබ නැරඹීය යුතුම වීඩියෝවක් පහත වෙයි.

[https://youtu.be/csosHts7IU8](https://youtu.be/csosHts7IU8)

## ●මූලික අංගරචනා අමුද්‍රව්‍ය

| අංගරචනා ද්‍රව්‍ය | | භාවිතා කරන අයුරු |
|---|---|---|
| ★පදනම් ආලේපය<br>Base makeup | පෑන් කේක්<br>pan cake | ★වතුරින් දිය කොට ස්පොන්ජ් කැබැල්ලකින් ආලේප කළ හැක.මුහුණේ වර්ණයට ගැළපෙන අන්දමින් වර්ණ තෝරාගත හැකිය. |
| ★ලයිනින් කලර්ස්<br>Lining colours | | ★විවිධ හැඩ ,රූප,වර්ණ මතු කිරීම සඳහා භාවිතා කරයි. |
| ★මේක්අප් පෙන්සිල්<br>Make up pencils | | ★හැඩතල මතු කිරීමට හා රේඛා ඇඳීමට භාවිතා කරයි. |
| ★ටූත් එනමල් tooth Enamals | | ★දත් වර්ණ කිරීම සඳහා භාවිතා කරයි. |
| ★බ්‍රෂ් හා ස්පොන්ජ Brush and sponges | | ★පින්සල් වලින් වර්ණ ආලේප කිරීමත් ස්පොන්ජ වලින් බේස්පවඩර ආලේප කිරීමත් සඳහා භාවිතා වෙයි. |
| ★නෝස් පොටි nose putty | | ★මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන් වල විවිධ සැඩ සැකසීම සඳහා යොදා ගනියි. |
| ★ක්‍රේප් හෙයා Crepe hair | | ★රැවුල් සඳහා භාවිතා කරයි.හණ හා කෘතීම ලෙස සැකසූ කෙඳි වර්ගයකි.විවිධ වර්ණ වලින් ලබා ගත හැකිය. |
| ★ස්ප්‍රිට් ගම් spirit glue | | ★රැවුල් ඇලවීමට සහ නෝස් පොටි සඳහා භාවිතා වෙයි. |
| ★රිමූවින් ක්‍රීම් removing cream | | ★මේක් අප් ඉවත් කිරීම සඳහා භාවිතා කරයි. |







Brush and sponges

nose putty







Base makeup

makeup pencils



Crepe hair

